"ජනතා හිතවාදී හා ඵලදායී රාජ්‍ය සේවයක් උදෙසා"

# ආණ්ඩුකාර ලේකම් කාර්යාලය - දකුණු පළාත
## ஆளுநர் செயலகம் - தென் மாகாணம்
## Governor's Secretariat - Southern Province

මගේ අංකය / எனது இல. / My Number: G/SP/1/1/2//2024

ඔබේ අංකය / உமது இல. / Your Number:

දිනය / திகதி / Date: 2024.01.12

ප්‍රධාන ලේකම්,
දකුණු පළාත.

**<u>පළාත් සභා මුල්‍ය රීති 562 ප්‍රකාරව චක්‍රලේඛ දකුණු පළාත් සභාවට අදාල කර ගැනීමට අනුමැතිය ලබාගැනීම. ( 2024 අයවැය යෝජනා අනුව රාජ්‍ය සේවයේ ජීවන වියදම් දීමනාව සහ වැන්දඹු / වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් දායක මුදල් අයකිරීම සංශෝධනය කිරීම.</u>**

උක්ත ශීර්ෂයෙන් යුතුව මා අමතන ලද ඔබේ අංක CSS/07/13/01 හා 2024.01.12 දිනැති ලිපිය හා බැඳේ.

02. එකී ලිපිය මගින්, 2024.01.10 දිනැතිව නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2024 හි විධි විධාන, දකුණු පළාත් සභා මූල්‍ය රීති 562 ප්‍රකාරව දකුණු පළාතට අදාළ කර ගැනීම සඳහා 2024.01.12 දින ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබාදී ඇති බව කාරුණිකව දන්වා එවමි.

03.අනුමත චක්‍රලේඛයේ පිටපතක් මේ සමග අමුණා එවමි.

ජයන්ත ජී.ලියනගේ
සහකාර ලේකම්
ආණ්ඩුකාර ලේකම් වෙනුවට
දකුණු පළාත.

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 03/2024

මගේ අංකය : EST-5/04/PCY/0019
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2024.01.10

මෙම රාජ්‍ය පරිපාලන/ රාජ්‍ය................................/
..........................................චක්‍රලේඛය / උපදෙස්
ලිපිය ............................ දින සිට
... අදාල කර ... සඳහා
ගරු ... අනුමැතිය.......................
දින ලබා දී ඇති බව සහතික කරමි.
................................................
...සහකාර ලේකම් / පරිනි.

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## 2024 අයවැය යෝජනා අනුව රාජ්‍ය සේවයේ ජීවන වියදම් දීමනාව සහ වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් දායක මුදල් අයකිරීම සංශෝධනය කිරීම

රජය විසින් ප්‍රකාශිත 2024 අයවැය යෝජනා අනුව රජයේ නිලධරයන් වෙත හා විශ්‍රාමිකයින් වෙත ජීවන වියදම් දීමනාව ගෙවීම සහ රජයේ නිලධරයන්ගෙන් වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් දායක මුදල් අයකිරීම සම්බන්ධයෙන් පහත පරිදි ක්‍රියා කළ යුතු ය.

02. 2024 වර්ෂයේ ජනවාරි මාසයේ සිට බලපැවැත්වෙන පරිදි මාසික ජීවන වියදම් දීමනාව වැඩි කිරීම සම්බන්ධව පහත පරිදි කටයුතු කළ යුතු ය.

2.1 රාජ්‍ය නිලධරයන් සඳහා

I. 2024 ජනවාරි මාසයේ සිට මාර්තු මාසය තෙක් මාසික ජීවන වියදම් දීමනාව ගෙවීමේ දී, දැනට මසකට ගෙවනු ලබන රු.7,800/- ක ජීවන වියදම් දීමනාවට, 2024 අයවැය යෝජනා අනුව වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව වන රු.10,000/-ක ජීවන වියදම් දීමනාවෙන් 50%ක් වන රු.5,000/-ක් එකතු කර, රු.12,800/-ක් ගෙවීම.

II. 2024 අප්‍රේල් මාසයේ සිට මාසික ජීවන වියදම් දීමනාව ගෙවීමේ දී රු.12,800/- ජීවන වියදම් දීමනාවට, 2024 අයවැය යෝජනා අනුව වැඩි කරන ලද රු.10,000/- න් ඉතිරි 50% වන රු.5,000/- එකතු කර රු.17,800/-ක් ගෙවීම.

III. 2024 ජනවාරි මාසයේ සිට මාර්තු මාසය තෙක් වූ හිඟ ජීවන වියදම් දීමනාව 2025 ජනවාරි සිට මාර්තු තෙක් මාසිකව රු.5,000/- බැගින් ගෙවා අවසන් කිරීම.

IV. තවද, 2024.01.01 දින හෝ එදිනට පසු විශ්‍රාම යන/ විධිමත් ලෙස සේවයෙන් ඉවත් වන/ මිය යන රාජ්‍ය නිලධරයන්හට ඔවුන් විශ්‍රාම ගන්නා දිනය/ විධිමත් ලෙස සේවයෙන් ඉවත් වන දිනය/ මිය යන දිනය තෙක් හිමි විය යුතු 2024 අයවැය යෝජනා අනුව වැඩිකළ සම්පූර්ණ ජීවන වියදම් දීමනාවෙන් ගෙවා නොමැති හිඟ මුදලක් ඇත්නම් එම හිඟ මුදල ඔවුන්ගේ අවසන් මාසික වැටුප සමඟ ගෙවීම.

2.2 අනියම්/ දෛනික වැටුප් ලබන සේවකයින් සඳහා

2013.12.31 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 37/2013හි විධිවිධාන යටතේ දැනට ගෙවනු ලබන රු.260/- ක දීමනාවට අමතරව, ඉහත 2.1හි I, II හා III යටතේ රජයේ නිලධරයන් සඳහා මාසිකව වැඩිකරනු ලබන ජීවන වියදම් දීමනාවේ අගය, අනියම්/ දෛනික වැටුප් ලබන සේවකයින් සඳහා එක් එක් මාසයේ සේවය කර ඇති එක් දිනකට 1/30 පදනම මත ගණනය කර ඉහත 2.1හි I, II හා III අනුව මසකට හිමි මුදල නොඉක්මවන පරිදි ඉහත 2.1හි I, II, III හා IV යටතේ ගෙවීම.

2.3 **ආධුනික හා පුහුණුලාභීන් සඳහා**

2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016හි උපලේඛන V යටතේ ඇතුළත් තනතුරු සඳහා ඉහත 2.1හි I, II, III හා IV යටතේ ගෙවීම.

2.4 **ත්‍රිවිධ හමුදා සාමාජිකයින් සඳහා**

ත්‍රිවිධ හමුදා සාමාජිකයින් සඳහා මෙම චක්‍රලේඛයේ ඉහත 2.1හි I, II, III හා IV යටතේ ගෙවීම.

2.5 **ගරු අමාත්‍යවරුන්ගේ පෞද්ගලික කාර්යමණ්ඩලය සඳහා**

ගරු අමාත්‍යවරුන්ගේ, ගරු රාජ්‍ය අමාත්‍යවරුන්ගේ, ගරු නියෝජ්‍ය අමාත්‍යවරුන්ගේ සහ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ අනුමත පෞද්ගලික කාර්යමණ්ඩල සඳහා ද පළාත් සභාවල ගරු ආණ්ඩුකාරවරු, ගරු ප්‍රධාන අමාත්‍යවරු හා ගරු පළාත් සභා අමාත්‍යවරුන්ගේ අනුමත පෞද්ගලික කාර්යමණ්ඩල සඳහා ද කැබිනට් අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ සහ පළාත් ප්‍රධාන ලේකම්වරුන්ගේ සම්බන්ධීකරණ ලේකම්වරු සඳහා ද මෙම චක්‍රලේඛයේ ඉහත 2.1හි I, II, III හා IV යටතේ ගෙවීම.

2.6 **විශ්‍රාම වැටුප්ලාභීන් සඳහා**

විශ්‍රාමිකයින් සඳහා දැනට ගෙවනු ලබන මාසික ජීවන වියදම් දීමනාව 2024 අප්‍රේල් මාසයේ සිට රු.3,525/- සිට රු.6,025/- තෙක් වැඩි කිරීම.

03. 2024 වර්ෂයේ අප්‍රේල් මාසයේ සිට වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනාත්දරු විශ්‍රාම වැටුප් දායකත්වය ලෙස සියලු ම රාජ්‍ය නිලධරයන්ගේ වැටුපෙන් 8%ක් අය කළ යුතු ය.

04. මෙම චක්‍රලේඛය මහා භාණ්ඩාගාරයේ එකඟතාව මත නිකුත් කෙරේ.

ප්‍රදීප් යසරත්න
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

දුරකථන : 011 2 673 330
ෆැක්ස් : 011 2 692 158
විද්‍යුත් ලිපිනය : ade-v@pubad.gov.lk

මෙම රාජ්‍ය පරිපාලන/~~රාජ්‍ය~~ ........................./
03/2024 ......... චක්‍රලේඛය / ~~උපදෙස්~~
........................................
ලිපිය 2024.01.12 දින සිට
දකුණු පළාත් ... වට අදාළ කර ගැනීම සඳහා
ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතිය 2024.01.12
දින ලබා දී ඇති බව සහතික කරමි.
........................................
ආණ්ඩුකාර ලේකම් / සහකාර ලේකම් / ප්‍රති.